# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 26 දරන පරිසර සංරක්ෂණ බදු පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 ජුනි මස 06 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ජුනි මස 06 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2008 අංක 26 දරන පරිසර සංරක්ෂණ බදු පනත

[සහතිකය සටහන් කළේ 2008 ජුනි මස 06 වැනි දින]

එල්. ඩී.—ඕ. 6/2008.

**පරිසරයට අහිතකර බලපෑම් ඇති කළ හැකි පාරිභෝගිකයන්ට අයිති නිශ්චිත අයිතමයන් මත හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරනු ලබන ඇතැම් නිශ්චිත අයිතමයන් මත හෝ ශ්‍රී ලංකාවේ දී සපයනු ලබන නිශ්චිත සේවා මත, පරිසර සංරක්ෂණ බද්දක් පැනවීම පිණිස ද; ඒ බද්ද එක් රැස් කිරීම හා අයකර ගැනීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 26 දරන පරිසර සංරක්ෂණ බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සහ ඉන් පසුව "පරිසර සංරක්ෂණ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් අයකරනු ලැබේ. වටිනාකම අනුව හෝ නිශ්චිත පදනමක් මත ගණන් බලනු ලබන පරිසර සංරක්ෂණ බද්ද මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පරිසර විෂයය භාර අමාත්‍යවරයා විමසා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුප්‍රමාණ අනුව— පරිසර සංරක්ෂණ බද්ද පැනවීම.

(අ) පාරිභෝගිකයකුට අයිති යම් නිශ්චිත අයිතමයක්;

(ආ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන නිශ්චිතව සඳහන් කරනු ලබන අයිතමයන්; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ දී සපයනු ලබන නිශ්චිත සේවාවන්,

මත පැනවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයේ බද්ද පනවනු ලැබිය හැක්කේ කවර අයිතම මත ද යන්න සහ කවර කාණ්ඩ මත ද යන්න නිශ්චිතව සඳහන් කළ හැකි ය.

3. (1) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2 වන වගන්තිය යටතේ පනවනු ලැබූ පරිසර සංරක්ෂණ බද්ද— පරිසර සංරක්ෂණ බද්ද එක්රැස් කිරීම, පරිපාලනය සහ අයකිරීම කළ යුතු ආකාරය.

(අ) පාරිභෝගිකයකුට අයිති අයිතමයක් සම්බන්ධයෙන් වන විට, පරිසර විෂයය භාර අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය

භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලබන ආයතනයක් මගින් එක් රැස් කරනු ලැබිය යුතු ය;

(ආ) ආනයනකරුවකු සම්බන්ධයෙන් වන විට එම ආනයනකරු විසින් ආනයනය කරනු ලැබූ සෑම නිශ්චිත අයිතමයක් සඳහා ම (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධානවලට අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එක් රැස් කිරීම සිදු කළ යුතු ය;

(ඇ) දේශීය නිෂ්පාදකයකු සම්බන්ධයෙන් වන විට, එබඳු නිෂ්පාදකයකු විසින් නිෂ්පාදනය කරනු ලබන සෑම නිශ්චිත අයිතමයක් සඳහා ම, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා පත් කරන ලද නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ පනතේ විධිවිධානවලට අනුව එක් රැස් කිරීම සිදු කළ යුතු ය;

(ඈ) නිශ්චිත සේවාවක් සම්බන්ධයෙන් වන විට, සේවා සපයන්නකු විසින් සපයනු ලබන සෑම නිශ්චිත සේවාවක් සඳහා ම, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා පත් කරන ලද නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ පනතේ විධිවිධානවලට අනුව එක් රැස් කිරීම සිදු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද යටතේ එක් රැස් කරනු ලබන පරිසර සංරක්ෂණ බද්ද අවස්ථාවෝචිත පරිදි , (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ හෝ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට අනුකූලව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා පත් කරන ලද නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එක්රැස් කිරීම, පරිපාලනය කිරීම හා අයකර ගැනීම කළ යුතු ය.

පරිසර සංරක්ෂණ බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු බව.

4. 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද නියමයේ නිශ්චිතව දැක්වෙන ආයතනය, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා පත් කරන ලද නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙම පනත ප්‍රකාරව පරිසර සංරක්ෂණ බද්ද ලෙස රැස්කළ සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලේ "පරිසර සංරක්ෂණ බදු ගිණුමට" ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

**5.** 2 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක් ම—

නියමය පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව.

(අ) එම නියමයට අමාත්‍යවරයා විසින් සිය අත්සන තැබූ වහාම ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) හැකි පහසු ඉක්මණින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය;

(ඇ) ඉන් පසුව හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය; සහ

(ඈ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබුවේ නම් එය යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, එම යෝජනා සම්මතයේ දින සිට බලපැවැත්වෙන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**6.** (1) 2 වන සහ 3 වන වගන්ති ප්‍රකාරව පනවා එක් රැස් කරනු ලබන පරිසර සංරක්ෂණ බද්ද ගෙවීමට බැඳී සිටින කිසියම් තැනැත්තකු බදු ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී, එකී බදු ගෙවීම පැහැර හරින ලද සෑම තැනැත්තකු සඳහා ම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණවලින් දණ්ඩනයන් පනවනු ලැබිය යුතු ය.

පරිසර සංරක්ෂණ බද්ද ගෙවීම පැහැර හැරි විට දණ්ඩනය.

(2) බද්ද ගෙවීම පැහැර හරින ලද සෑම තැනැත්තකු ම 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාර බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු අතර, පැහැර හරින ලද මුදල් ප්‍රමාණය අය කර ගැනීම සම්බන්ධයෙන් ඒ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) එවැනි පැහැර හැරීමකට අදාළ කරුණු සනාථ කර ගැනීම සඳහා සුදුසු යයි සලකනු ලබන පියවර, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගනු ලැබිය යුතු අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉන් පසුව පැහැර හරින ලද මුදල් ප්‍රමාණය සහ දණ්ඩනය අය කර ගත යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී, අවස්ථාවෝචිත පරිදි, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද නියමයේ නිශ්චිතව දැක්වෙන ආයතනයට හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ

කාර්ය සඳහා පත් කරන ලද නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැහැර හැර ඇති මුදල් ප්‍රමාණය සහ දණ්ඩනය අය කර ගැනීමට ක්‍රියාකිරීම සඳහා උපදෙස් ලබා දිය යුතු ය. මේ සඳහා අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ කලින් කළට මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කළ යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය** [7 වන වගන්තිය]

| | I වන තීරය<br>*දණ්ඩනය ගෙවීමට යටත් පුද්ගලයන්* | II වන තීරය<br>*ගෙවිය යුතු දණ්ඩනය* |
|---|---|---|
| 1. | නිශ්චිත අයිතමයක් අයිති පාරිභෝගිකයකු | රුපියල් පන්සියයක ට නොඅඩු සහ රුපියල් දෙදහසක ට නොවැඩි |
| 2. | ආනයනකරුවකු | රුපියල් පන්දහසක ට නොඅඩු සහ රුපියල් දසදහසක ට නොවැඩි |
| 3. | දේශීය නිෂ්පාදකයකු | රුපියල් පන්දහසක ට නොඅඩු සහ රුපියල් දසදහසක ට නොවැඩි |
| 4. | සේවා සපයන්නකු (ශ්‍රී ලංකාව තුළ) | රුපියල් පන්දහසක ට නොඅඩු සහ රුපියල් දසදහසක ට නොවැඩි |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.